# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1639/4 - 2010 පෙබරවාරි 01 වැනි සඳුදා - 2010.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1990 අංක 04 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල ප්‍රඥප්තියේ 2 (2) වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වන හේවා ලොකුගේ ජයසිරි මහතා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේ දී ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තිය සහ 1990 අංක 4 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2 (1) වගන්තිය යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු වන එදිරිමුණි සමිත් ද සිල්වා මහතා පත්කර ඇත.

02. තවද දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි සමඟ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(3)(අ)(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපති වන හේවා ලොකුගේ ජයසිරි මහතා එකී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිධුරයේ කටයුතු කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ.

03. තවද, 1990 අංක 04 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3)(අ)(1) වගන්තිය යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභාපතිධුරයේ

කටයුතු කල හේවා ලොකුගේ ජයසිරි මහතා එම ධුරයේ කටයුතු කිරීම වහාම අත්හිටුවා ඇති හෙයින් ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යය ඉටුකිරීමටත් 1990 අංක 4 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 (2) වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3)(අ) (1) වගන්තිය අනුව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ කටයුතු කරන සිරිසේන රත්නායක වීරකෝන් මහතාට විධාන කරනු ලැබේ.

ෂාන් විජයලාල් ද සිල්වා,<br>
මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,<br>
ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල ඉංජිනේරු<br>
සේවා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන<br>
විෂය භාර අමාත්‍ය, දකුණු පළාත.

2010 පෙබරවාරි මස 01 වැනි දින.

02-344

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.